# ඉන්දියාවේ පළාත් ආණ්ඩුකරණය

ඉන්දියාවේ පළාත් පාලන පද්ධතිය පංචයාති රාජ් (Panchayathi raj) යනුවෙන් හඳුන්වනු ලැබේ. මෙම පළාත් පාලන පද්ධති සහ ක්‍රම පුරාණ ඉන්දියාවේ එනම් බ්‍රිතාන්‍ය විසින් ඉන්දියාව පාලනය කිරීමට පෙර සිටම පැවති රාජාණ්ඩු යුගයන්හි පැවති ග්‍රාම පාලන ක්‍රම සහ පද්ධති වල විකාශනයක් ලෙස දැක්විය හැකිය. පුරාතන ඉන්දියාවේ පැවති මෙම ග්‍රාම පාලන ක්‍රම බ්‍රිතාන්‍යයන් විසින් හඳුන්වා දුන් දිස්ත්‍රික් පාලන ක්‍රමයන් සමඟ අහෝසි වී ගියද 1947 ඉන්දියාවට නිදහස ලැබීමත් සමඟ පැරණි පංචායත් ග්‍රාම පාලන ක්‍රමය නැවත ස්ථාපිත කිරීමේ අවශ්‍යතාව පැන නැගිනි.

මීට අදාළ කතිකාවත ගොඩනැඟෙන්නේ දිස්ත්‍රික් පාලන ක්‍රමය යටතේ ග්‍රාමීය පාලන ක්‍රම හා පළාත් පාලන ව්‍යුහයන් නොවීමත් ග්‍රාමීය ජනතාවට රාජ්‍ය පාලනයට (Community Governance) හවුල් වීමට ඇති ඉඩ ප්‍රස්ථා නොමැතිවීමත් දිස්ත්‍රික් ආදායම් නිලධාරී (District Collector) කාර්යය භාරය හුදෙක් ආදායම් රැස් කිරීමත්, ඉඩම් පරිපාලනයත්, අධිකරණ ක්‍රියාවලියත් ඊට අදාළව පොලිස් බලතල ක්‍රියාවේ යෙදීමත් වැනි ව්‍යවස්ථාපිත කාර්යයන් සඳහා සීමා වීමක් යන ප්‍රස්තුතයන් මතයි.

ග්‍රාම සංවර්ධනය සහ ග්‍රාම ස්වයං පාලන (Village Self Governance) පිළිබඳව මහත්මා ගාන්ධිතුමා විසින් විශේෂ අවධානයක් යොමු කර පැරණි පංචයාති ක්‍රමය නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා උපදෙස් දෙනු ලැබීය. මෙම ක්‍රමය මඟින් රාජ්‍යයේ කටයුතු ගම් මට්ටමට විමධ්‍යගත කිරීමේ හැකියාවත් සංවර්ධන කාර්යයේදී ජනතා දායකත්වය ලබා ගැනීමත් එම ආයතන පාලනය ජනතාවට පැවරීමේ අවස්ථාවන් ඇති කර ගත හැකි බව මහත්මා ගාන්ධිතුමාගේ අදහස විය.

අද දවසේ ඉන්දියාවේ ක්‍රියාත්මක වන පංචායත් ක්‍රම සහ ව්‍යුහයන් පෙර පැවති සම්ප්‍රදායික ක්‍රමයට වඩා වැඩි දියුණු කළ තත්ත්වයකි. ග්‍රාම රාජ්‍ය ක්‍රමය පළාත් පාලනයේ මූලික ව්‍යුහය ලෙස හැඳින්වීමට පුළුවන. පංචායත් ව්‍යුහය වර්තමානයට ගැලපෙන පරිදි සකස් කර ගැනීම සඳහා අවශ්‍ය නිර්දේශ ලබා

ගැනීමට 1957 වර්ෂයේ බලවාන්ට රායි (Balawant Rai) කොමිෂම පත් කරන ලදී. එම කොමිෂමේ 1952 ක්‍රියාත්මක කළ ප්‍රජා සංවර්ධන වැඩසටහන් (Community Development Programme) සහ 1953 ක්‍රියාත්මක කළ ජාතික ව්‍යාප්ති සේවා (National Extension Service) සහ මීට පෙර ක්‍රියාත්මක වූ සාම්ප්‍රදායික පංචායති ක්‍රම පිළිබඳ අධ්‍යයනය කරන ලදී.

මෙම කොමිෂම විසින් 1958 වර්ෂයේ නව නිර්දේශ ඉදිරිපත් කරමින් පංචායති රාජ් ආයතනයක ව්‍යුහය ඉන්දියාවේ සෑම ප්‍රාන්තයකම ක්‍රියාත්මක කිරීමට උපදෙස් දෙන ලද අතර මෙම ක්‍රමය අභ්‍යන්තර විමධ්‍යගත කරන වැඩපිළිවෙළක් ලෙස හඳුන්වා දෙන ලදී. මේ මඟින් ස්ථර තුනකින් යුත් (three tier) පංචායති රාජ් ව්‍යුහයක් ඇති කිරීමට යෝජනා කරන ලදී. එම ව්‍යුහය වන්නේ

01. ග්‍රාම පංචායත් (Grama Panchayathi)
02. පංචායත් සමිති (Block Panchayathi)
03. දිස්ත්‍රික් පංචායත් (Zila Panchayathi)

ග්‍රාම පංචායත්, ගම් මට්ටමේ පිහිටවනු ලබන පළාත් පාලන ව්‍යුහය වන අතර පංචායත් සමිති කොට්ඨාශයක් සඳහාද දිස්ත්‍රික් පංචායත් ආයතන දිස්ත්‍රික්ක මට්ටමෙන්ද ව්‍යුහ ගත කර ඇත.

ග්‍රාම පංචායත් ව්‍යුහයට අමතරව නගර පරිපාලනය සඳහාද විශේෂ පළාත් පාලන ආයතන ව්‍යුහයක් පවතී. නාගරික ව්‍යාප්තිය සහ නාගරිකරණ ප්‍රවාහය අනුව මෙම පළාත් පාලන ආයතන දෙයාකාරවේ.

01. නගර පාලිත සභා (Nagar Palika, Municipal Council or Municipal Corporation) හෝ මහ නගර සභා හෝ නගර සංස්ථා වශයෙන් හඳුන්වන ව්‍යුහය විසල් නගර හෝ ප්‍රධාන නගර පරිපාලනය සඳහා වන ව්‍යුහයකි.

02. නගර පංචායත් (නගර සභා) (Town Panchayathi or Nagar Panchayathi) මහනගර සභාවට වඩා පරිපාලනයෙන් අඩු නගර හෝ සුළු නගර සඳහා නගර පංචායත් සභා ව්‍යුහය ක්‍රියාත්මක වේ.

1959 වර්ෂයේ සිට මෙම පළාත් පාලන ව්‍යුහය ඉන්දියාවේ ක්‍රියාත්මක වන අතර අද වන විට ප්‍රාන්ත රාජ්‍ය කීපයක හැර අනෙකුත් සියලුම ප්‍රාන්තවල ක්‍රියාත්මකවේ. මෙම ව්‍යුහය 1997 වසරේ අනුමත වූ 73 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් නීති ගත කරනු ලැබ ඇත. ඒ අනුව පංචායත් ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී ඒ ඒ පළාතට ආවේණික ලෙස වෙනස්කම් සහිතව ක්‍රියාවට නංවනු ලැබේ.

## 73 වන ව්‍යවස්ථා සංශෝධන

1992 සම්මත කරනු ලැබූ මෙම සංශෝධනය මඟින් ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 40 වන ව්‍යවස්ථාවට පංචායත් ආයතන පිහිටුවීම පිළිබඳවත් ඒවායේ බලතල පිළිබඳව කරුණු ඇතුළත් කර ඇත. මේ මඟින් ප්‍රාන්ත රාජ්‍යන් තමන්ට ගැළපෙන ආකාරයේ පංචායත් ව්‍යුහයන් සහිත පංචායත් රාජ්‍ය පනත් අනුමත කර ගැනීමට අවශ්‍ය විධිවිධාන සලසා ඇත. එසේම 40 වන ව්‍යවස්ථාවට ඇතුළත් කර ඇති 11 වන උප ලේඛනය මඟින් විෂයයන් 29 පංචායත් ආයතන වල විමධ්‍යගත කර ඇත. එම විෂයයන් පහත සඳහන් පරිදි වේ.

01. කෘෂිකර්ම ව්‍යාප්ති සේවාද ඇතුළුව කෘෂිකර්ම කටයුතු (Agriculture)
02. ඉඩම් ඒකාබද්ධ කිරීම (Consolidation)
    පාංශු සංරක්ෂණය (Soil Consolidation)
    ඉඩම් වැඩිදියුණු කිරීම සහ ඉඩම් ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැඟීම.
03. සුළු වාරිමාර්ග, ජල කළමනාකරණ සහ ජලධාරා සංරක්ෂණය (Water and Watershed Management)
04. සත්ත්ව පාලන කටයුතු (Animal husbandry)
05. ධීවර කටයුතු (Fisheries)
06. ප්‍රජා සහ කෘෂි වන වගා කම්ටු (Community & Agroforestry)
07. කුඩා ප්‍රමාණයේ වාණිජ කටයුතු
08. කුඩා ප්‍රමාණයේ කර්මාන්ත (Small Industries)
09. කර්මාන්ත ගම්මාන සහ ගෘහස්ත කර්මාන්ත (Khadi Village and Cottage Industry)
10. ග්‍රාමීය නිවාස (Rural Housing)

11. පානීය ජලය (Drinking Water)
12. දැව හා ඉන්ධන
13. මාර්ග (පාලම්, බෝක්කු සහ ජැටි ඇතුළත්ව)
14. ග්‍රාමීය විදුලි සැපයුම් (Rural Electricity)
15. දිළිඳුකම තුරන් කිරීමේ වැඩසටහන් ( Poverty alleviation)
16. සම්ප්‍රදායික නොවන බලශක්ති
17. ප්‍රාථමික සහ ද්විතික අධ්‍යාපනය
18. තාක්‍ෂණික සහ වෘත්තිය අධ්‍යාපනය
19. අවිධිමත් අධ්‍යාපනය
20. පුස්තකාල සේවා
21. සංස්කෘතික කටයුතු
22. වෙළඳපොළවල් / සතිපොළවල්
23. ආරෝග්‍යශාලා , ප්‍රාථමික සෞඛ්‍ය මධ්‍යස්ථාන, ඩිස්පැන්සරි ඇතුළුව, සෞඛ්‍ය හා සනීපාරක්‍ෂක කටයුතු
24. පවුල් සුභසාධනය
25. ළමා හා කාන්තා කටයුතු ප්‍රවර්ධනය
26. මානසික හා ශාරීරික ආබාධ පුද්ගලයින්ගේ කටයුතු ඇතුළත් සමාජ සුභසාධනය
27. උපලේඛන කරන ලද සමාජ කණ්ඩායම්වල සුභසාධනය
28. මහජන උපයෝගිතා සේවා
29. පොදු දේපල නඩත්තුව සහ කළමනාකරණය (Common Property Management)

## <u>කෝරල ප්‍රාන්තයේ පංචායත් පංචායති රාජ ව්‍යුහය සහ ක්‍රියාත්මක වන ආකාරය.</u>

මා මුලින් සඳහන් කළ පරිදි ඉන්දියාවේ ක්‍රියාත්මක වන පළාත් පාලන ව්‍යුහ හා ක්‍රම ඒ ඒ ප්‍රාන්ත රාජ්‍ය තම තමන්ට ගැළපෙන ආකාරයේ යම් වෙනස්කම් වලින් යුක්ත වුවද පොදුවේ පංචායත් මූලධර්ම සහ සම්මතයන් සෑම ප්‍රාන්තයකට එකසේ ආදේශ කරගෙන ඇත. අධ්‍යනය පහසුව සඳහා ඉන්දියාවේ

කේරළ ප්‍රාන්ත රාජයයේ පංචායත් ව්‍යුහය සහ පාලන ක්‍රම පිළිබවඳව අධ්‍යයනය කිරීම මගින් පොදුවේ ඉන්දියානු පංචායත් ග්‍රාම රාජ්‍ය ක්‍රමය පිළිබඳව අදහසක් ලබාගත හැකිය.

1994 කේරළ ප්‍රාන්ත රාජ්‍ය විසින් පංචායති රාජ්‍ය පනත සහ මහ නගර සභා පනත සම්මත කිරීම මගින් අද ක්‍රියාත්මක පංචායතියේ ව්‍යුහය ස්ථාපනය කර ඇත. මේ මගින් ග්‍රාම මට්ටම දක්වා ආර්ථික සංවර්ධනය සහ සමාජ සංවර්ධනයට අදාල බලය හා වගකීම පවරා ඇත. පහත සඳහන් පළාත් පාලන ආයතන කේරළ ප්‍රාන්තය තුළ ක්‍රියාත්මක වේ.

| | | | |
|---|---|---|---|
| 1. | ග්‍රාම පංචායත් (Grama Panchayathi) | - | 941 |
| 2. | කොට්ඨාශ පංචායත් (Block Panchayathi) | - | 152 |
| 3. | දිස්ත්‍රික්ක පංචායත් සීලා පංචායත් (Zila Panchayathi) | - | 14 |
| 4. | නගර පංචායත් (Municipal Panchayathi) | - | 87 |
| 5. | නගර සංස්ථා (Municipal Corporation) | - | 06 |
| | එකතුව | - | 1200 |

පංචායත් රාජ්‍ය ආයතනයේ සභාපති ප්‍රධාන විධායකයා වේ. ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධාන නිලධාරීන් පංචායත් සභාවේ පාලකයන්ට යටත් වේ. ඒ ඒ විෂය සඳහා වන ලේකම් කාර්යාලයක් ලෙස පංචායතියේ ආයතනය ක්‍රියාත්මක වේ. පංචායතියේ ආයතනයේ නිලධාරීන්ගේ සේවකයින් ගේ මෙන්ම පංචායත් ආයතනයට අනුයුක්ත කර ඇති නිලධාරීන්ගේ විනය කටයුතු භාර වන්නේද පංචායත් සභාවටයි.

<u>ග්‍රාම පංචායත් සභාව (Grama Panchayathi)</u>

ග්‍රාම පංචායත් සභාව ගම් මට්ටමේ පවතින පළාත් පාලන පරිපාලන ව්‍යුහයකි. ඡන්දයෙන් තේරී පත්වන නියෝජිතයන් ගෙන් සමන්විත මෙම සභාවේ සභාපති ජනපදයෙන් තෝරා ගනු ලැබේ. (Sarapanch) අවුරුදු 05 ක කාලයක් සඳහා මෙම සභාව බල පැවැත්වනු ලැබේ.

<u>කොට්ඨාශ පංචායත් සභා (Block Panchayathi)</u>

මෙම ආයතනය පංචායත් සමිති ලෙස ද හඳුන්වනු ලැබේ. මේවා සංවර්ධන කොට්ඨාශ (Development Block) ලෙස හඳුන්වනු ලැබේ.

මෙම සමිති ග්‍රාම පංචායත් ආයතන සහ දිස්ත්‍රික් පංචායත් ආයතන සම්බන්ධතා ආයතනයක් (Link institution) වශයෙන්ද කටයුතු කරයි. සෑම ග්‍රාම පංචායත් ආයතනයක් විසින් එකේ සිට තුන දක්වා නියෝජිතයන් ගණනක් කොට්ඨාශ පංචායත් සඳහා තෝරා පත් කර ගනු ලබන අතර, ග්‍රාම පංචායත් සභාවේ සභාපති නිල බලයෙන්ම කොට්ඨාශ පංචායත්හි සාමාජිකයත්වය දරනු ලැබේ.

<u>දිස්ත්‍රික් පංචායත් ( Zila Panchayathi)</u>

කොට්ඨාශ පංචායත් ඡන්දයෙන් දිස්ත්‍රික් පංචායත් සභාවට සෘජුවම නියෝජිතයින් 01 සිට 03 දක්වා ප්‍රමාණයක් පත්කර ගනු ලබන අතර, කොට්ඨාශ පංචායත් සභාවල සභාපතිවරු නිල බලයෙන්ම දිස්ත්‍රික් පංචායත්හි නියෝජනය කරනු ලබයි. එසේම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයින් ද පාර්ලිමේන්තු මන්ත්‍රිවරු ද මෙම සභාවේ නිල බලයෙන්ම සාමාජිකත්වය උසුලයි (මෙම තත්ත්වය විවිධ ප්‍රාන්තවල වෙනස් ආකාරයෙන් ක්‍රියාත්මක වේ.)

<u>ගම් සභා (Grama Sahba)</u>

පංචායත් ව්‍යුහය ස්ථර තුනකින් සමන්විත වන බව සඳහන් කළද මෙම ව්‍යුහයට අදාලව ගම් මට්ටමේ කටයුතු සම්බන්ධිකරණය, නියෝජනය කිරීම සහ ප්‍රජා දායකත්වය සඳහා වන ග්‍රාම ඒකකයක් පවතී. මෙම ගම් සභා වෝඩ්ස් සභා (Ward Sabha) හෝ පාලි සභා (Palli Sabha) යනුවෙන් ද හඳුන්වනු ලැබේ. ගම් සභා ප්‍රදේශ තුළ සියලූම ඡන්දදායකයින් මෙම සභාවේ සාමාජිකයින් වේ.

මෙම සභා වලට ව්‍යවස්ථාපිත බලයන් හෝ කාර්ය භාරයක් නොපවති. එසේ වුවත් ප්‍රජා ආණ්ඩුකරණය සඳහා වන ජන සහභාගිත්වය ලබා ගැනීම සිදුවන්නේ මෙම ගම් සභා මගිනි. මෙම සභා මාස 2 – 3 කට වරක් තම රැස්වීම් පවත්වනු ලබන අතර, සමහර ග්‍රාම පංචායත් විසින් ගම් සභාවල රැස්වීම් දිනය සහ න්‍යාය පත්‍රය ප්‍රකාශයට පත්කර ඇත.

මෙම සභා විසින් තම ගම් සඳහා ක්‍රියාකාරි සැලැස්මක් සකස් කරනු ලැබේ. එම සභාව වාර්ෂිකව තම කටයුතු පිළිබඳ වාර්තාවන් ද ගිණුම් වාර්තාවන්ද ඉදිරිපත් කළ යුතුවේ. එසේම ග්‍රාම පංචායත් විසින් ක්‍රියාත්මක කරන සංවර්ධන යෝජනා

සකස් කිරීමත් විවිධ වැඩසටහන් වල ප්‍රතිලාභීන් තේරීමත් මෙම සභාවල වගකීම වේ. මෙම ගම් සභාවක් එක් ඡන්ද කොට්ඨාශයක් සඳහා වන බැවින් ග්‍රාම පංචායත් නියෝජිතයින් මෙම සභාව නියෝජනය කළ යුතුවේ.

## පංචායත් සභාවල බලතල හා කාර්යභාරය

### ග්‍රාම පංචායත්

ග්‍රාම පංචායත්වල ව්‍යවස්ථාපිත කාර්යභාරය පහත සඳහන් පරිදිවේ.

01. සනීපාරක්ෂාව, ජල අපවාහන කටයුතු සහ මහජන දුෂ්කරතා මැඩලීම.
02. වසංගත රෝග නිවාරණය සහ පාලනය
03. පානීය ජල සැපයුම සහ ජල ප්‍රභවයන් සුරක්ෂිත කිරීම
04. මංමාවත් සහ වීදි ඉදිකිරීම්, අළුත්වැඩියා සහ නඩත්තුව
05. අනවසර ඉදිකිරීම්, අල්ලා ගැනීම් ඉවත් කිරීම
06. පොදු ජල තටාක නඩත්තුව සහ සංරක්ෂණය
07. පොදු කටයුතු සඳහා ප්‍රජා දායකත්වය ලබා ගැනීම
08. ග්‍රාම පංචායත් අරමුදල පරිපාලනය
09. දේපළ තක්සේරුව සහ බදු අය කිරීම

## ප්‍රාන්ත රාජ්‍ය විසින් පවරනු ලබන කාර්යයන්

01. ප්‍රාථමික, සාමාජීය,තාක්ෂණික , වෘත්තිය සහ වැඩිහිටි අධ්‍යාපනය
02. ග්‍රාමීය රෝහල්, සෞඛ්‍ය මධ්‍යස්ථාන, මාතෘ නිවාස සහ ළමා සුභසාධන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම
03. පෙරි සේවා පවත්වාගෙන යාම හා නඩත්තුව
04. වාරිමාර්ග කටයුතු
05. ආහාර නිෂ්පාදන වැඩසටහන්
06. අවතැන් පුද්ගලයින් පුනරුත්ථාපනය කිරීම.
07. සත්ත්ව පාලනය
08. වගානොකළ ඉඩම් වගා කිරීම සහ ඉඩම් වැඩි දියුණු කිරීම හා පස සංරක්ෂණය ඇතුළු ඉඩම් ප්‍රතිසංස්කරණ කටයුතු
09. ප්‍රජා සහ සාමාන්‍ය වන සංරක්ෂණ කටයුතු

10. සමූපකාර කටයුතු ( කෘෂි සමූපකාර)
11. ඉඩම් නිවාස යෝජනා ක්‍රම ක්‍රියාවට නැංවීම
12. ග්‍රාමීය විදුලි සැපයුම් කටයුතු
13. කාන්තා හා ළමා සංවර්ධන කටයුතු

මීට අමතරව පංචායත් විසින් තමන්ගේ බල ප්‍රදේශවල පහත සඳහන් කටයුතු ක්‍රියාවට නැංවීම සඳහා අතුරු ව්‍යවස්ථා සම්පාදනය කළ හැකිය.

01. මහජන වීදි ආලෝකකරණය, වීදි අලංකරණය හා නඩත්තුව
02. වෙළඳ සැල් ඉදිකිරීම් සහ පරිපාලනය
03. ගෘහස්ථ කර්මාන්ත වැඩිදියුණු කිරීම
04. දඩාවතේ යන ගවයින් සහ සුනඛයින් පාලනය කිරීම
05. ක්‍රීඩා, සංස්කෘතික කටයුතු
06. පසුගාමී සමාජ කණ්ඩායම්වල සුභසාධන කටයුතු

## <u>කොට්ඨාශ පංචායත් හෝ පංචායත් සමිතිවල බලතල හා කාර්යභාරය (Block Panchayathi)</u>

පොදුවේ පංචායත් සමිතිවල කාර්යභාරය පහත සඳහන් පරිදි වර්ගීකරණය කළ හැක.

01. විමධ්‍යගත කාර්යභාරය ( Delegated Functional )
02. ප්‍රජා සංවර්ධන කාර්යභාරය (Community development functional )
03. අධීක්ෂණ කාර්යභාරය ( Supervisory functional )

## විමධ්‍යගත හෝ පැවරූ කාර්යභාරය

ප්‍රාන්ත රාජ්‍ය විසින් නිර්ණය කරනු ලැබූ ප්‍රතිපත්ති සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය කිරීම.

## ප්‍රජා සංවර්ධන කාර්ය භාරය

පහත සඳහන් විෂය ගොනු යටතේ ප්‍රජා සංවර්ධන සහ සුභසාධන කාර්යයන් සැලසුම් කිරීම ක්‍රියාත්මක කිරීම.

- කෘෂි
- වාරිමාර්ග
- ගෘහස්ත හා කුඩා කර්මාන්ත
- සමූපකාර
- අධ්‍යාපන

එසේම මෙම විෂයයන්ට අදාලව සුවිශේෂි ගැටළු සම්බන්ධව පර්යේෂණ හා අත්හදා බැලීම් සිදුකිරීමටද හැකියාව කොට්ඨාශ පංචායත් සභාවට පවතී.

## අධීක්ෂණ කාර්යභාරය

කොට්ඨාශ පංචායත් ආයතනවලට පැවරෙන විශේෂ කාර්යයක් වන්නේ ග්‍රාම පංචායත් කටයුතු අධීක්ෂණය කිරීමක් ඔවුන්ගේ වැඩසටහන් සහ අයවැය විග්‍රහ කිරීම ප්‍රති ව්‍යුහ කිරීම වැනි කටයුතුය. එසේම ග්‍රාම පංචායත් සහ දිස්ත්‍රික් පංචායත් අතර සම්බන්ධීකරණ කටයුතු ඉටු කරනු ලබයි.

## දිස්ත්‍රික් පංචායත් බලතල හා කාර්යභාරය

ශිලා පංචායත් හෝ දිස්ත්‍රික් පංචායත් සභා පිහිටුවා ඇත්තේ දිස්ත්‍රික් පදනමින්ය. මෙම සභාවල සාමාජිකයන් ලෙස පංචායත් සමිතිවල සභාපතිවරු නිලබලයෙන්ම පත්වේ. මීට අමතරව ව්‍යවස්ථා සභාවේ සමාජිකයින්ද ප්‍රදේශයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ද, කාන්තා සහ පසුගාමී සමාජ කොටස්වල නියෝජිතයින් මෙම සභාවල සමාජිකත්වය දරයි. තවද සමූපකාර බැංකු වැනි ආයතනවල නිලධාරීන්ද උපදේශක මට්ටමේ මෙම සභාවලට සහභාගීවේ.

පොදුවේ ගත්කළ ශිලා පංචායත් සභාවල කාර්යභාරය පහත සඳහන් පරිදිවේ.

### 01.සංවර්ධන කාර්යයන්

තම බල ප්‍රදේශයේ කොට්ඨාශ පංචායත් සභා විසින් ක්‍රියාත්මක කරන සංවර්ධන ව්‍යාපෘති සහ අනෙකුත් සංවර්ධන කටයුතු බලාත්මක කිරීම.

ඒවගේම මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පැන නැගෙන ගැටළු සහ දුෂ්කරතා විසඳීම සඳහා ප්‍රාන්ත රාජ්‍ය සමඟ සාකච්ඡා කිරීම සහ සුදුසු විසඳුම් ලබාදීම.

**02. සිවිල් ඉදිකිරීම් කටයුතු**

ප්‍රධාන මාර්ග, පාලම්, බෝක්කු, උද්‍යාන, ජල සැපයුම් ව්‍යාපෘති ඉදිකිරීම සහ නඩත්තුව

**03.සුභසාධන කටයුතු**

වෙළඳසැල්, මහජන පුස්තකාල පවත්වාගෙන යාම, සෞඛ්‍ය මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම සහ මහජන සුභසාධන කටයුතු ඉටු කිරීම.

**04. සම්බන්ධීකරණ කටයුතු**

සිලා පංචායත් සියලුම කොට්ඨාශ සමිති සම්බන්ධීකරණය කරනු ලැබේ.

**05. මූල්‍ය කටයුතු**

කොට්ඨාශ සහ ග්‍රාම පංචායත්වල අයවැය පරීක්ෂාව සහ අනුමැතිය, මුදල් වෙන් කිරීම සහ මූල්‍ය පාලනය.

**06.උපදේශාත්මක කාර්යභාරය**

කොට්ඨාශ සහ ග්‍රාම පංචයාත් සඳහා සියලුම කටයුතු පිළිබඳව උපදේශාත්මක සේවා පවත්වාගෙන යාම.

**<u>පංචායත් ආයතනවල කමිටු ව්‍යුහය</u>**

පංච ග්‍රාම සභා කොට්ඨාශ පංචායත්හි ස්ථාවර කමිටු 03 බැගින්ද දිස්ත්‍රික් පංචායත්හි ස්ථාවර කමිටු 05 බැගින් ද ක්‍රියාත්මකවේ. පංචායත් ආයතනවල සියලුම නියෝජිතයන් කුමක් හෝ මෙම කමිටුවක සාමාජිකත්වය දරයි. මෙම කමිටුවලට පැවරෙන කාර්යයන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ වගකීම මෙම කමිටුවලට පැවරේ. සම්බන්ධීකරණය සඳහා පංචායත් ආයතනවල සභාපති / නියෝජ්‍ය සභාපති සහ කමිටු සභාපතිවරුන්ගෙන් සැදුම්ලත් මෙහෙයුම් කමිටුවක් පවතී. මීට අමතරව විශේෂඥයින්ගෙන් සමන්විත ක්‍රියාකාරි කමිටු සහ උප කමිටු පවත්වා ගැනීමේ හැකියාව පවතී.

## පංචායත් ආයතන පිළිබඳ ප්‍රාන්ත රාජ්‍ය කාර්යභාරය

පංචායත් රාජ් පනත සහ මහනගර සභා පනත් මඟින් මධ්‍යම රාජ්‍ය හෝ ප්‍රාන්ත රාජ්‍යය පංචායත් ආයතන කෙරෙහි පවතින සෘජු පාලනය සීමාකර තිබෙනවා. එසේ වුවත් රාජ්‍ය සහ ප්‍රාන්ත රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳව උපදෙස් සහ මඟපෙන්වීම් ප්රාන්ත රජය විසින් සිදු කරනු ලැබේ. එසේම පංචායත් ආයතන විසින් පනවනු ලබන අනපනත් ව්‍යවස්ථානුකූල නොවන විට සහ ඒ සඳහා අනුගමනය කළ ක්‍රියාපටිපාටිය නොගැලපීම මත අවලංගු කිරීමේ බලය ප්‍රාන්ත රජයට පවතී. පංචායත් ආයතන තමන්ගේ වාර්ෂික අයවැය සම්මත කර ගැනීමට නොහැකි වුවහොත් හෝ බහුතරයක් නියෝජිතයන් අස්වුවහොත් එම ආයතන විසුරුවා හැරීමේ බලය ප්‍රාන්ත රාජ්‍යට පවතී.

## පංචායත් ආයතන පාලනය සහ හැසිරවීම සඳහා පවතින ස්වාධීන ආයතන

- **ප්‍රාන්ත මැතිවරණ කොමිසම**

  ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 243 K ව්‍යවස්ථාව අනුව පංචායත් ආයතනවල මැතිවරණ පැවැත්වීම සහ ඊට අනුසාංගික කටයුතු ප්‍රාන්ත මැතිවරණ කොමිෂම විසින් සිදු කරනු ලැබේ. ඒ අනුව මැතිවරණ ලේඛන සකස් කිරීම සහ පවත්වාගෙන යාම නියෝජන කොට්ඨාශ නිර්ණය කිරීම ඇතුළු කටයුතු මෙම කොමිෂම විසින් සිදු කරනු ලැබේ. සෑම වසර 5 කට වරක් පංචායත් ආයතන සඳහා මැතිවරණ පවත්වනු ලබන අතර ග්‍රාම කොට්ඨාශ සහ දිස්ත්‍රික් පංචායත් සඳහා එකම මැතිවරණයකින් නියෝජිතයින් තෝරා ගනු ලැබේ.

- **ප්‍රාන්ත රාජ්‍ය මුදල් කොමිෂම**

  පංචායත් ආයතන පිළිබඳ මූල්‍ය පාලනය සහ මූල්‍ය පාලන පිළිබඳ උපදෙස් ලබා දීම මෙම කොමිෂම විසින් සිදු කරනු ලැබේ.

- **පළාත් පාලනය පිළිබඳව ඔම්බුඩ්ස්මන්ගේ කාර්යය භාරය**

  පංචායත් ආයතන තම කාර්යය ඉටු කිරීමේදී සිදු කරනු ලබන අක්‍රමිකතා විමර්ශනය කිරීම සහ ඊට අදාළ නියෝග ලබා දීම ඔම්බුඩ්ස්මන්ගේ කාර්යයවේ.

**<u>පංචායත් ආයතනයන්හි කළමනාකරණ ව්‍යුහය</u>**



## ග්‍රාම පංචායත්හි පරිපාලන කටයුතු

පංචායත්හි ප්‍රධානියා වන්නේ සභාපතිවරයාය. එහි පරිපාලන කටයුතු සිදු කරනු ලබන්නේ ග්‍රාම පංචායත් ලේකම්වරයා මඟිනි. ඔහු ප්‍රාන්ත රාජ්‍ය විසින් පත් කරනු ලැබේ. ග්‍රාම පංචායත් ලේකම්වරයාගේ කාර්ය භාරය පහත සඳහන් පරිදි වේ.

01. පංචායත් ලේකම්වරයා විසින් සභා රැස්වීම්, ස්ථාවර කමිටු රැස්වීම් වල ලේකම් ලෙස කටයුතු කරනු ලබන අතර, ඔහුට එම අවස්ථාවලදී යෝජනා ඉදිරිපත් කිරීම හෝ ඡන්දය ප්‍රකාශ කිරීම සිදු කළ නොහැක. එසේ වුවත් ඔහුගේ අදහස් වර්තා ගත කළ හැකිය.
02. පංචායත් ආයතනය විසින් ගනු ලබන තීරණ ක්‍රියාවේ යෙදවීම.
03. සියලුම සේවකයින්, නිලධාරින්ගේ පරිපාලන සහ විනය කටයුතු සිදු කිරීම.
04. නීතියෙන් පැවරී ඇති බලතල ක්‍රියාවේ යෙදවීම.
05. පංචායත් අරමුදල පාලනය සහ සියලුම ගෙවීම් කටයුතු
06. වාර්ෂික සැලසුම් සහ වැඩසටහන් සහ වාර්ෂික අයවැය සකස් කිරීම.
07. වාර්ෂික ගිණුම් ප්‍රකාශ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම.

## කොට්ඨාශ පංචයාත් සභාවේ පාලන කටයුතු

කොට්ඨාශ පංචායත් හෝ පංචායත් සභාවේ ප්‍රධානියා වන්නේ ඡන්දයෙන් තෝරා පත් කර ගනු ලබන සභාපතිවරයාය. එහි ප්‍රධාන විධායක නිලධාරියා වන්නේ කොට්ඨාශ සංවර්ධන නිලධාරියා (Block Development Officer) කොට්ඨාශ පංචායත් වලට පැවරී ඇති කාර්යයන් ඉටු කිරීම, නෛතික කටයුතු සහ මූල්‍ය කටයුතු ඉටු කිරීම් මෙම නිලධාරියා විසින් සිදු කරනු ලැබේ. මීට අමතරව සභාව සහ ඊට අදාල කමිටුවල ලේකම් කාර්යය ඉටු කරනු ලබන්නේද මෙම නිලධාරියා විසිනි.

## දිස්ත්‍රික් පංචායත් කමිටු පරිපාලනය

දිස්ත්‍රික් පංචායත් සඳහා ඡන්දයෙන් තේරී පත් වන සභාපතිවරයෙකු සිටී. දිස්ත්‍රික් පංචයාත් සභාවල පරිපාලන කටයුතු මෙහෙයවනු ලබන්නේ ප්‍රධාන විධායක නිලධාරියා විසිනි. (chief executive officer) ඉන්දියා පරිපාලන සේවයට

අයත් නිලධාරියෙකු වන ඔහු රජය විසින් පත් කරනු ලැබේ. මෙම නිලධාරියා විසින් පහත සඳහන් කාර්ය භාරය ක්‍රියාවට නංවනු ලැබේ.

- විධායක නිලධාරියාට පැවරී ඇති සියලුම නෛතික බලතල ක්‍රියාවට නැංවේ.
- සියලුම නිලධාරින් හා සේවකයින්ගේ පරිපාලන හා විනය කටයුතු ක්‍රියාවට නැංවීම.
- දිස්ත්‍රික් පංචයාත් විසින් ක්‍රියාවට නංවන සියලු ව්‍යාපෘති වැඩ බලාත්මක කිරීම
- දිස්ත්‍රික් පංචයාත් අරමුදල් පරිපාලනය
- සියලුම වාර්තා තබා ගැනීම.
- සභා රැස්වීම් ස්ථාවර කමිටු සහ මෙහෙයුම් කමිටු ලේකම්වරයා ලෙස කටයුතු කිරීම
- අභ්‍යන්තර විගණන කටයුතු

මීට අමතරව ප්‍රධාන විධායක නිලධාරියාට සහය වීම සඳහා ගණකාධිකාරිවරයෙක්ද, ප්‍රධාන සැලසුම් නිලධාරියෙකුද පරිපාලනය සඳහා නියෝජ්‍ය ලේකම්වරයෙක්ද සිටී.

## ඉන්දියාවේ ක්‍රියාත්මක වන පංචායත් ග්‍රාම සහ පළාත් පාලන ක්‍රම සහ ඊට අදාල ව්‍යුහයන් අධ්‍යයනය කිරීමෙන් අපට උගත හැකි පාඩම් මොනවාද යන්න සලකා බලමු.

01. දුරදක්නා  රාජ්‍ය නායකත්වයක අවශ්‍යතාවය නිසි මඟ පෙන්වීම සහ උපදේශනය.
02. යම් වැඩපිළිවෙළක් හෝ නව පාලන ව්‍යුහයක් ඇති කිරීමට පෙර ඒ පිළිබඳව විධිමත්  අධ්‍යනයක් සිදු කිරීමේ අවශ්‍යතාවය.
03. නව ව්‍යුහයන්, ක්‍රමවේද, ව්‍යාපෘති හෝ වැඩසටහන් ක්‍රියාවට නැංවීමේදී ඒ පිළිබඳව ප්‍රතිපත්තිමය එකඟතාවය සහ පොදුවේ පිළිගත් ප්‍රතිපත්තියක අවශ්‍යතාවය.
04. නව ක්‍රමවේදයක් හෝ ව්‍යුහයක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ව්‍යවස්ථාමය සංශෝධන හා ප්‍රතිසංස්කරණ.

05. බලය විමධ්‍යගතකරණය නියමිත අරුත හඳුනා ගැනීම සහ පැහැදිලිවම සහ නිශ්චිතවම විෂයයන් හඳුනා ගැනීම. (ඉන්දිය ව්‍යවස්ථාවේ 73 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් ප්‍රකාශිත 11 වන උපලේඛනය විමධ්‍යගත විෂය කරුණු නිශ්චිතවම හඳුනා ගෙන ඇත.)

06. එක් එක් ව්‍යුහයන් හා ආයතන අතර කාර්යය සහ වගකීම නිසි පරිදි බෙදා වෙන් කිරීමේ අවශ්‍යතාවය හා ඊට අදාළ සීමාවන් නිසි පරිදි නිර්ණය කිරීමේ අවශ්‍යතාවය

07. පළාත් පාලන විෂය පථය ප්‍රශස්ථව හඳුනා ගැනීම සහ එම කාර්යයන් ඒ ඒ පළාත් පාලන ආයතන අතර නිසි පරිදි බෙදා වෙන් කිරීම සහ මධ්‍යම හෝ ප්‍රාන්ත රාජ්‍ය විසින් පළාත් පාලන ආයතන වලට බෙදා වෙන්කළ කාර්යයන් හෝ ඊට අනුශාංගික කාර්යයන් ඉටු නොකිරීමට වග බලා ගැනීම.

08. නීතිය ක්‍රියාවේ යෙදවීම සඳහා ඇති උපරිම කැපවීම.

09. පර්යේෂණ සහ අත්හදා බැලීම් පිළිබඳව පවතින පුළුල් ඉඩ කඩ

**සටහන :-**

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් කෙයා ජාත්‍යන්තරය (Care International) ආයතනයේ මූල්‍ය අනුග්‍රහය යටතේ සංවිධානය කළ 2016.03.22 සිට 2016.03.31 දක්වා ඉන්දියාවේ කේරල ප්‍රාන්තයේ කේරල පළාත් පාලන ආයතනය (KILA) විසින් මෙහෙය වූ ඉන්දියාවේ පංචායත් පළාත් පාලන ක්‍රම සහ ව්‍යුහයන් පිළිබඳ අධ්‍යයනයේදී මා ලැබූ අත්දැකීම් සහ ඊට අදාල එම ආයතන විසින් ලබාදුන් ලේඛන හා අන්තර් ජාලයෙන් ලබා ගත් තොරතුරු අධ්‍යයනය කිරීමෙන් මෙම සටහන සකස් කර ඇති බව සලකන්න.

ගාමිණී රාජකරුණා
ඌව පළාතේ ප්‍රධාන ලේකම්.